සන්නස

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**

email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




# නීතිය හා පොලීසිය

රටක පොලීසියට පැවරෙන ප්‍රධාන කාර්යය වන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වාගෙන යමින් මහජනතාවගේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම ය. ඕනෑම සමාජයක විවිධ පන්ති අතර ගැටුම් ඇති වීම නොවැළැක්විය හැක්කකි. ඒ ගැටුම් සමනය කිරීම අරභයා ඉතිහාසය පුරා පොලීසිය විසින් කරන ලද කාර්යයන්හි වටිනාකම් පිළිබඳව කිසිදු විවාදයක් නැත . එහෙත් වත්මනේ ඒ පොලීසිය පත්වී ඇති තත්වය අතිශයින් කණගාටුදායක ය. ඒ තත්වය කෙතරම් ද යත් තම උසස් නිලධාරීන්ගේ පීඩනයට එරෙහිව ආයතනයේම පහළම නිලය දරන්නකුට තමන්ට යුක්තිය ඉටුකරවා ගැනීමට මන්සන්ධියක ප්‍රසිද්ධියේ බැරලයකට බැස විරෝධය දැක්වීම දක්වා දුර දිග ගොස් තිබේ. රටක නීතිය ආරක්ෂා කිරීම පිණිස පිහිටුවනු ලැබූ ආයතනයක නිලධාරීන්ට පවා යුක්තිය උදෙසා එලෙස උද්ඝෝෂණය කරන්නට සිදුවනවා නම් සාමාන්‍ය ජනතාවට ඒ අයතනයෙන් යුක්තිය ඉටු වේ යයි විශාවාසය තැබිය හැකි ද?

පොලිසිය තව දුරටත් මහජනතාවට යුක්තිය ඉටු කරන ආයතනයක් නොවන දැන් දැන් රටේ ජනතා සිත් සතන්හි ලියැවෙමින් තිබෙයි. මිනිසුන් පොලීසියට අභියෝග කරන තැනට රට තල්ලු වී ඇත්තේ එනිසා ය. අප පසුගිය දා කහවත්තේ දීත් දොම්පේ දීත් කරන්දෙණියේදීත් දුටුවේ මහජනතාව පොලීසියට අභියෝග කරන ආකාරයයි.

පොලිසිය අද පත්ව ඇති අසරණ නින්දිත තත්වයට කෙළින්ම ඇඟිල්ල දිගු කළ හැක්කේ අදේශපාලන බල අධිකාරියටත් පොලිසියේ දූෂිත නිලධාරි පැලැන්තියටත් ය.

පොලීසිය ස්වාධීන ආයතනයක් ලෙස පැවතෙන්නට ඉඩ නොදී එය දේශපාලකයන්ගේ ඕනෑ එපා කම් අනුව නැටවෙන රූකඩ ආයතනයක් බවට අද පත් කර ඇත. අලුතින් පත්ව එන සෑම පොලිස්පතිවරයකුම පොලිසිය හරහා නීතිය ස්ථානය කිරීම පිළිබඳව කොයි තරම් කයිවාරු ඇද බෑවත් මාසයක් හමාරක් යන විට ඒ සියලුම නිලදරුවන් දේශපාකයන්ගේ පා ලෙවකන තරම් පහත් මට්ටමට ඇද වැටෙන සැටි මහජනතාව දකින විට තමන්ට හිමි යුක්තිය ඉටුකරවා ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග වලට ඔවුන් යොමු වීම තර්කාණුකූලය.

තමන්ට යුක්තිය ඉටු කරන්නට පිහිටුවා ඇති ආයතන කෙරෙහි ඇති විශ්වාසය දිගින් දිගටම පලුදු වන විට එම ආයතන වලට අභියෝග කරමින් නීතිය තමන් අතට ගෙන කෝපය පිට කරගන්නට අද මහජනතාව පෙළෑඹී ඇත. සමාජය තුළ පෝෂණය වෙමින් මහා රුකක් ලෙසින් වැඩෙමින් පවතින විශ්වාස භංගත්වය හා කළකිරීම මේ සමාජය තල්ලුකරමින් තිබෙන්නේ ප්‍රචන්ඩ ලෙස විරෝධය පෑමේ අන්තය දක්වාය. මෙය හොඳ ප්‍රවණතාවක් නොවේ.

මේ තත්වය සමනය කර ගත හැකි වන්නේ පොලීසියට ස්වාධීන ආයතනයක් ලෙස සිය සේවාව කරගෙන යාමට ඇවැසි පසුබිම සකස් කිරීමත් දූෂිත නිලධාරින් හඳුනා ගෙන පොලිසිය පිරිසිදු කිරීමත් යන ක්‍රියාමාර්ග තුළින් පමණකි. නමුත් අවාසනාවට රජය ඒ වෙනුවට කරන්නට උත්සාහ ගන්නේ කළකිරීමෙන් අපේක්ෂා භංගත්වයෙන් පීඩිතව පෙරට ආ මිනිසුන් අල්ලා ඔවුන් දඩුකඳේ ගැසීම තුළින් තත්වය පාලනය කරගන්නටය. මෙය අසාර්ථකම උපායමාර්ගයක් බව පොඩි දරුවකුට වුව තේරුම් ගත හැකිය. මර්දනයෙන් ජනතා සිතුම් පැතුම් පාලනය කරගෙන සිටින්නට උත්සාහ කිරීම අසාර්ථක පාලකයන්ගේ ස්වභාවයයි. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් ගෙන එය විසඳීමට ඇවැසි පියවර ගන්නවා වෙනුවට, ප්‍රශ්නයක් ඇති බව පෙන්වා දෙන මහජනතාව මට්ටු කරන්නට යාම කොයි තරම් ප්‍රඥාගෝචර දැයි රජයට උපදෙස් දෙන පණ්ඩිතයන් පාලකයන්ට පෙන්වා දිය යුතු කාලය එළැඹ ඇතැයි අපට සිතෙයි.

සමාජයක නීතියේ ආධිපත්‍යය බිඳ වැටීම ඉතා විශාල ව්‍යසනයක ආරම්භය විය හැකි ය.

සංස්කාරක - සන්නස

ශ්‍රී ලාල් ප්‍රියන්ත



# ආණ්ඩුවට "ස" රෝගය?

මහින්ද රාජපක්ෂ යනු. ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයාය. සියලුම බලතල සියතේ දරාගෙන වැජඹෙන සේනාධිනායකයාය. ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු සමස්ත ආරක්‍ෂක පද්ධතියම දෝතට ගෙන සිංහරූඩ වී සිටින ආරක්‍ෂක ඇමැතිවරයාය.

ඔහුගේ සහෝදරයා වු ගෝඨාභය රාජපක්‍ෂ තමන් යටතේ පාලනය වන රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාය. සිය මහින්ද රාජපක්‍ෂ අයියාගේ විධායක ජනාධිපති බලතල වලින් පෝෂණය වී දිවයිනේ සෑම අස්සක් මුල්ලක් නෑරම තම අභිමතය පරිදි ආරක්‍ෂක බලය පතුරමින් මර්දනය හස්තය සියතට ගෙන සිටින බලධාරියාය.

තත්ත්වය එසේ තිබියදී, ජනාධිපති මහින්ද රාජපක්‍ෂගේ වෘත්තීය සමිතී කටයුතු පිළිබඳ අධ්‍යක්‍ෂ ජෙනරාල් භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහ දවල් දෙනෝදහසක් බලා සිටියදී වෙඩි තබා මරා දමයි නම්, රටේ ආරක්‍ෂාවේ සුරක්ෂිතභාවය කුමක්ද? ලෝකයා මේ ගැන කුමක් හිතයිද? රටේ විධායක ජනාධිපති වරයාගේ වෘත්තීය සමිති අධක්‍ෂක ජෙනරාල්වරයාටත් නිදහසේ ජීවත්වීම උදෙසා සුදුසු ආරක්‍ෂක පද්ධතියක් රට තුළ නොමැති නම්. මේ රටේ ජනතාවගේ ආරක්‍ෂාව ගැන තවත් කුමන කතාද?

වරක් ශ්‍රී ලංකාවේ හිටපු ප්‍රථම විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන ප්‍රකාශ කළේ ''තමන්ගේ ආරක්‍ෂාව තමන් විසින්ම සළසා ගත යුතු බවය. '' මහින්ද රාජපක්‍ෂත් මෙවැනි සිදුවීම් වලින් අපට කියාපාන්නේ එවැනි දෙයක්ද? එසේ නම්, අපට ඇසීමට සිදුවන්නේ තමන්ගේ ආරක්‍ෂාව තමන් විසින් සළසා ගතයුතු නම්, රටකට ජනාධිපතිවරයෙක් කුමටද? ආරක්‍ෂක ඇමැතිවරයෙක් කුමටද? ආරක්‍ෂක ලේකම්වරයෙක් කුමටද ? ආරක්‍ෂක හමුදාවක් හෝ පොලිසියක් කුමටද? යන්නය.

ඒවා වෙනුවෙන් වැය කරන රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වෙනත් මහජන සුබසාධන කටයුත්තක් උදෙසා වැයකළ හැක. අපරාධයේ නිල පරාදේ එවැනි දේවල් වලට මහජන මුදල් වැය කිරීමේ තේරුමක් නැත.
මේ රටේ සාමාන්‍ය ජනතාව වන අපට කැත්තක්, පොල්ලක් තිබුණොත් අපට අපේ ආරක්‍ෂාව සළස්වා ගත හැක. ආණ්ඩුව ඒ ගැන කලබල වියයුතු නැත. සිදුකළ යුත්තේ රටේ ආරක්‍ෂාව වෙනුවෙන් යැයි කියමින් තවදුරටත් මුදල් කාබාසිනියා නොකර ජනාධිපතිවරයාත්, ආරක්‍ෂක ලේකම්වරයාත් කොට්ට මෙට්ට ටික පටෝ ගෙන ගෙදර බැරි නම්, යන දෙවස්ථානයක යෑමය.

රටේ ආරක්‍ෂාව වෙනුවෙන් යැයි ප්‍රකාශ කරමින් සෑම වසරකම අය වැයෙන් වැඩිම මුදලක් වෙන් කරනනේ රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යංශය වෙනුවෙනි. මෙරව 2011 අය වැයත් එසේය. රටේ අත්‍යවශ්‍ය කාරණා වන අධ්‍යාපනය, සෞඛ්‍ය, මහජන සුබ සාධනය යනාදී කටයුතු වෙනුවෙන් අයවැයෙන් වෙන්වන්නේ සුළු මුදලකි. රටේ සංවර්ධනය හා මානව අයිතීන් වෙනුවෙන් වැය කළයුතු අති විශාල මුදලක් ඒ වෙනුවෙන් වැය නොකර ආරක්‍ෂාව වෙනුවෙන් යැයි පවසා ආරක්‍ෂක අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කිරීමෙන් රටේ ආරක්‍ෂාවත් සංවර්ධනයටත් දෙකම සිදුවී නැත.

සිදුවී ඇත්තේ සංවර්ධනයත් ආරක්‍ෂාවත් දෙකම වළපල්ලට තල්ලු කර යැවීමකි. රටේ නිසි සංවර්ධනයක් සිදුවන්නේ නම්, බඩු මිල ඉහළ යෑමේ හැකියාවක් නැත. ජීවන බර දරා ගත නොහැකි ලෙස ජනතාව පීඩාවට පත්වන්නේ නැත. රැකිරක්‍ෂා නොමැතිව තරුණ තරුණියෝ මහමඟ පෝස්ටර් බැනර් එල්ලා ගෙන උද්ඝෝෂණ කරන්නේ නැත. මංකොල්ල කෑම් එන්න එන්නම වැඩි වන්නේ නැත. ගොවියෝ තමන්ගේ වගාවන් වලට නිසි මිලක් නොමැතිව ලතවෙන්නේ නැත.

හත් වන පිටට